# පෙරියකඩු නැලව රජමහා විහාරස්ථානය ආශ්‍රිතව පවතින ගල් ලෙන් පිළිබඳව විමර්ශණාත්මක අධ්‍යයනය.

ජේ.ඒ. ඉඳුනිල් ජයතිලක[1]

මෙම පර්යේෂණය පෙරියකඩු නැලව විහාරස්ථානය ආසන්නයේ ඇති ගල් ලෙන් පාදක කොට ගනිමින් සිදුකොට ඇත. අවුරුදු 2000 ට පමණ වැඩ ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ මෙම විහාරස්ථානය වළගම්බා රජසමයට අයත් යැයි සැලකේ. වයඹ  පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ ඉහළ විසි දෙකේ බස්නාහිර කෝරළයේ පෙරියකඩු නැලව ගම්මානයේ පිහිටා ඇත. බ්‍රාහ්මීය අක්ෂර සහිත කටාරම් කොටන ලද ගල් ලෙන් රැසක් මෙම ප්‍රදේශයේ දක්නට ලැබේ. මීට අමතරව මෙම ස්ථානය ආශ්‍රිතව සෙල් ලිපි 5ක් ද දක්නට ඇත. මේවා ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් කියවීමෙන් අනතුරුව Inscription of Ceylon ග්‍රන්ථයටද ඇතුලත් කොට ඇත. පර්යේෂණයේ ගැටළුව වනුයේ මෙම ස්ථානය මෙවැනි වූ ලෙන් රැසක් ඉදි කිරීමට යොදා ගත්තේ මන්ද යන්න අධ්‍යයනය කිරීම වේ. මෙම පර්යේෂණය සිදුකිරීමේ අරමුණ වනුයේ මෙම ගල් ලෙන් සකස් කොට ඇත්තේ කිනම් අරමුණක් මුදුන්පත් කරගැනීම උදෙසා ද යන්න අධ්‍යයනය කිරීම සඳහා වේ. ප්‍රධාන වශයෙන් මෙම අධ්‍යයනය සිදුකිරීමේ දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය කිරීම සිදුවිය. එහිදී හමුවු පුරාවස්තු අධ්‍යයනය, ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා ප්‍රධාන වශයෙන් මේ සඳහා යොදාගන්නා ලදී. මේ අනුව මෙම පර්යේෂණයේ දී මා ගොඩනගන්නා වු උපන්‍යාසය වනුයේ මෙම ස්ථානය අතීතයේ සිටම භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කළ ස්ථානයක් ලෙස පවතින්නට ඇති බවයි. ඒ බව සනාථ කෙරෙන්නා වූ පුරාවස්තු හා පාරිසරීය සාධක මෙම ගම්මානය පාදක කර ගනිමින් විසිරී පවතින බැවින් ඒවා අධ්‍යයනය කිරීම තුළින් මෙම සාධකයන් සනාථ කර ගැනීමට හැකියාව ඇත. ඒ අනුව මෙම පර්යේෂණයෙන් සනාථ කෙරෙන්නා වු සාධකයන් ලෙස ගල් ලෙන් තුළ තිබී හමුවන ගොඩනැගිලි අවශේෂ, කටාරම්, සෙල්ලිපි, විවිධ ආකාරයේ මැටි භාණ්ඩ අවශේෂ දැක්විය හැකිය. මේ අනුව යථෝක්ත පර්යේෂණ ගැටළුව ඉදිරි විමර්ෂණයන් තුළින් සනාථ කොට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද :- පෙරියකඩු නැලව, කටාරම්, සෙල්ලිපි, ගල් ලෙන්, පුරාවස්තු

[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, induniljayathilaka@yahoo.com